**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - විභාග ජයමග ප්‍රශ්න පත්‍රය**

03

**71 සිංහල - I පත්‍රය**

**නව විෂය නිර්දේශය**

කාලය - පැ. 3.00

නම -     සැකසුම - දර්ශනපති ගිහාන් හෙට්ටිආරච්චි     දිනය -

■ සැලකිය යුතුයි - පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් හතරක් තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න)

**01) (අ)** බමුණාණෝ ගෙට ගොසින් බැමිණියන් බණවාලා පින්වත මහණගොයුම්හු පවරා ගෙනවුත් දන් වළඳවාලා ප්‍රශ්න විචාරමි. **දන් සරහ'යි කියා සම්මත කොටලා වෙහෙරට ගොසින් බුදුන් නොවැඳ ම සාදසාමීචි ලෙස කථාත් නොකොට ම එකත්පස් ව සිට භවත් ගෞතමයෙනි, භික්ෂු සංඝයා හා සමග අද අපගේ ආරාධනා නිසා අපගේ ගෙයිදී වැළඳුව මැනැවැයි කිවුය.** බුදුහුත් බොහෝ ප්‍රයෝජන සලකා ආරාධනාවේ අරුමයක් නැතත් ඉවසා වදාළ සේක. බමුණාණෝ බුදුන් ඉවසා වදාළ නියාව දැන වහා ගෙට ගොසින් නැතක් දවස් නියඟ කොට තබාලා බිම තෙමා වස්නා මහ වැස්සක් මෙන් නැතක් කලක් ම තමන් කළවිරූ දෙයක් නොවන හෙයින් අරුමයක් සේ දෙන දන යහපත් කොට සැරහුය. බුදුරජුන්වහන්සේ ද නකත්තරු පිරිවරා නික්මුණු සඳ පරිද්දෙන් මහණගණා පිරිවරා බමුණාණන්ගේ ගෙට වැඩ පනවන ලද බුදුහස්නෙහි යුගඳුරු මුදුනෙහි වොරජනා ළහිරුමඬලක් මෙන් වැඩහුන් සේක. භික්ෂුසංඝයා වහන්සේ ද රන් නැවක් මධ්‍ය කොට පිපී වැනී ගිය රත්නෙළුම් වනයක් මෙන් වැඩහුන් සේක. බමුණාණෝ ද බුදුපාමොක් සංඝයාවහන්සේ සිය අතින් සකස්කොට වැළඳූ ය. එදවස් මිථ්‍යාදෘෂ්ටිකයන්ගෙනුත් සම්‍යක්දෘෂ්ටිකයන්ගෙනුත් බොහෝ දෙන රැස් වූහ.

i. බමුණා බුදුන් කැඳවූයේ කවර අරමුණකින් ද?

ii. මෙහි ඇතුළත් අර්ථාලංකාරයක් නම් කොට ඊට නිදසුනක් උපුටා දක්වන්න.

iii. තද කළු අකුරින් දැක්වෙන කොටසෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

iv. 'සකස්කොට' යන්නෙහි අර්ථය විග්‍රහ කොට ලියන්න.     (ලකුණු 04 යි)

**(ආ)** හිඟන්නවුන්ට දුන මැනව. තෑගි යයි කියා දෙති. පෙර කෑ ණයයි කියා දෙති. පෙර කෑ අතපැන්දියයි කියා දෙති. මෙසේ මෙසේ නොයෙක් ප්‍රකාරයෙන් එක කුඹුරෙහි වී වියදම් කොට ඉතිරි දෙයක් ගෙනවුත් කොටුවෙක පටවාගෙන බිජුවට යයි එක් භාගයක් තබා ගත මැනව. ඇස් යයි එක් භාගයක් වෙන් කොට බිජුවටභාගය නොකා ඇස් භාගය කැව මැනව. එසේ කන කල පමණ නොදැන නොකා අදට මෙතෙක් ගත මැනව. සෙටට මෙතෙක් ගත මැනැවැයි පමණ දැන කැව මැනව. මතු මෙතෙක් දවස් ගිය කල ගොයම් පැසෙයි. එවක දක්වා රැකුණ මනා වේදැයි සිතසිතා සුගින් සුග කැවමැනව. මෙසේ එක් සමයෙක දුක් ගෙන උපයා ගත් කල අනික් සමයෙහිත් පෙර නොකළා සේ ම මෙසේ වීර්ය කළමනා ය. මෙසේ දිවිහිමියෙන් ම යලත් මාසත් අප්‍රමාද ව මෙහෙ කළ මැනව. පරීක්ෂා කළ කල ගොවීහු නිකම් හිඳිනා දවසෙක් නම් නැත. ලෙඩට හොත් කලත් උපයා කෑ නොහැක්ක. සේවාකම් ආදි වූ නොයෙක් කටයුත්තෙහි නියුක්ත ව ගිය කලත් ගම හිඳ උපයා කෑම නම් නැත් ම ය. **මහලු ව ජරාවට පැමිණි කලත් මෙකී කර්මාන්ත කොටගත නොහැකි හෙයින් උපයා කෑ නොහැක්ක. එකල දැතින් දෙදඬු ගෙන විලිපිළියෙන් විරූප ව කුද ගසාගෙන පෙර තමා උපයා කෑ රටට ම වෙස් බැඳ පානා විකාර රූපයක් සේ දොරින් දොර සිඟා කා ඇවිද්දමනා ම ය.** එසේ හෙයින් මලණ්ඩ, නුවණැසින් බැලුවානට මෙසසර සුව විඳීමෙක් නොවෙයි. දුක් විඳීමෙක් ම ය.

i. මෙහි දැක්වෙන පරිදි ගොවියෙකුගේ අනාගතය ඉතා අවිනිශ්චිත බව පැවසිය හැක්කේ කෙසේ ද?

ii. අස්වැන්න ගෙට ගත් පසු අනුභව කළ යුත්තේ කිනම් කොටස ද?

iii. තද කළු අකුරින් දැක්වෙන කොටසෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

iv. 'අතපැන්දිය' යන්නෙහි අර්ථය විග්‍රහ කරන්න. (ලකුණු 04 යි)

**(ඇ)** එසඳ බරණැස් රජ්ජුරුවෝ ඒ ගායනා ශබ්දය අසා පියසන් නො ඇසෙන සේ සෙමෙන් අවුදින් ලියකිඳුරාණන් උන් නියාව ද නටමින් සිටි කිඳුරාංගනාවන් ද දැක පිළිබඳ වූ සිත් ඇති ව 'මේ කිඳුරා විද දිවි තොර කොට මෑ හා සමග වාසය කෙළෙම් නම් යහපතැ'යි සිතා සැඟවී සිට කිඳුරාට හීයක් විද්දේ ය. ඒ ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලේ දියෙන් මහත් වේදනාවෙන් මඬනා ලදුව හඬන්නේ ය. 'සබඳ චන්ද්‍රිකාව, මේ මාගේ ජීවිතය තව ද ආයු ඇති ව තිබිය දී සන්තතිවිච්ඡේදයෙන් නැසෙමියි සිතමි. එබැවින් මම තිගේ ක්‍රීඩා විනෝදයෙහි නෙඇලෙමි. **ලද ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලෙහෙයෙන් රැඳී ඔත්තා වූ හා මාගේ ජීවිතය නොබෝ කලකින් කඳ සැඟවෙන්නේ ය. කකියා ගිය තලතෙලක ලූ තණ සෙයින් ද මුලින් සිඳ හෙලූ ගසක් සෙයින් ද නියං සමයෙහි පැන් සිඳී වියළී ගිය මළ හෝකඳුරක් සෙයින් ජීවිත විනාශයට පැමිණෙන සේ බලව.** පර්වයෙක්හි වසන ලදුව ක්ෂණ ක්ෂණයෙහි වැහෙන්නා වූ වර්ෂා ජල ධාරාවක් සෙයින් ද කඳුළු වැහෙන්නට පටන් ගත්තේ ය.

i. සර පහර ලත් කිඳුරා කිඳුරිය අමතා මෙබඳු ප්‍රකාශයක් කරන්නේ ඇයි?

ii. බරණැස් රජු කිඳුරු යුවළ වෙත පැමිණියේ කෙසේ ද?

iii. තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

iv. 'සන්තතිවිච්ඡේදයෙන්' යන්නෙහි අර්ථය විග්‍රහ කොට ලියන්න (ලකුණු 04 යි)

**(ඇ)** මහත් වූ වීර්ය ඇති අනන්ත ඥානයෙන් යුක්ත වූ ස්වයම්භූඥානයෙන් සියල්ල ගෙවා දත්තා වූ මුළුලොවට හිතාන්වේසී වූ තුන්ලොවට අසහාය නායක වූ ලෝකස්වාමී වූ අනාථනාථ වූ භාග්‍යවත් වූ ත්‍රෛලෝක්‍ය ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ උදෙසා දැන් මා විසින් පුදන ලද්දා වූ **මේ මල් පූජාවෙහි අනුසසින් මතු සසර මම උපනුපන් ජාතියෙහි යහපත් රූ ඇති වෙම්වයි මනෝඥවූ ආරෝහපරිණාහයෙන් යුක්ත වෙම්වයි ශරත් කාලයෙහි ගුවන් මැද දිලිසෙන සූර්යමණ්ඩලය පරිද්දෙන් මාගේ සියලඟින් රස්මිමාලාවෝ විහිදෙත්ව යි** මා දුටුවා වූ යම් ම පුරුෂයෙක් කාමයෙන් මුර්ඡා ව හෙවයි ලියකිඳුරන්ගේ නාද මෙන් සියල්ලවුන් ළඟන්නා ඉතා කන්කලු වූ මිහිරි කටහඬ ඇති වෙම්වයි යනාදීන් මෙසේ ප්‍රාර්ථනා කළා ය.

මෙසේ මල් පුදා ප්‍රාර්ථනා කළ ඉක්බිති ඒ කුමාරිකාවන්ගේ මෑණියෝ අවුත් තමන් දියණියන් මලස්න ශුද්ධ නොකොට මල් පිදූ බව දැක 'එම්බල චණ්ඩාල කෙල්ල, අත්‍යන්ත නිර්මල වූ බුදුරජාණන් වහන්සේට මලස්න නොසෝධා කුමක් පිනිස මල් පිදී ද?'

i. බුදුන් වහන්සේගේ ගුණයන් දෙකක් ලියන්න.

ii. මව දියණියට බැණ වැදුණේ ඇයිදැයි පහදන්න.

iii. තද කළු අකුරින් දැක්වෙන කොටසෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

iv. 'ළඟන්නා' යන පදයේ අර්ථය විග්‍රහ කොට දක්වන්න. (ලකුණු 04යි)

**(ඉ)**

සරා සලෙලු දන සතො සේ
සුරා පාන කරන ලෙ සේ
**පුරා අවුලු නොයෙක ර සේ**
**සරා අවන්හල් සහ සේ**

උ දා නිඳු කර හ      රණේ
වි දා අඳුරු දිසි කි      රණේ
යොදා දෙපස රන් තො      රණේ
ස දා මෙලෙස පුර දෙ      රණේ

i. සලෙලු ජනයා සතු ගුණාංග දෙකක් ලියන්න.

ii. නගරයේ අඳුර දුරු වූයේ කුමකින් ද?

iii. තද කළු අකුරින් දැක්වෙන කොටසෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

iv. අවන්හල් හා දිනිඳු යන පදවල අර්ථ දක්වන්න      (ලකුණු 04 යි)

(ඊ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න

i. "තෙල උඩුමහලේ දෙවඟනක සේ සිටින්නේ කවුරු ද?"

ii. "මම තී පාදපරිචාරිකා කොට සොළොස් දහසක් පුරඟනාවන්ට අග මෙහෙසුන් කෙරෙමි."

iii. "එසේ හෙයින් ආචාරීභාගය නොගෙනායෙමි"

iv. "දැන් මරතී කියා මුසුප්පු වන්ට පිළිවන් ද?"

v. "ඉතින් ඒ බෙත්වලින් ගුණයක් නැද්ද?"

vi. "නවතිවු නවතිවු, කවුද ඔබ දෙදෙන"

vii. "අක්කා මට දැන් හිරයක් ගන්න කාලේ හොඳා"      (ලකුණු 3×4 - 12යි)

(උ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න

නොවැලෙපෙමි ඔබ යන්න - වැලප ඇති පල කිම් ද?
ජීවිතේ වැරදුණේ මෙතැන විතරක් නො වේ
සූරලා ගෙන යන්න මා හදේ පිපුණු මල්
මල් නඟන වසන්තය ඔබට ගෙන යා හැකි ද?

නොවැලෙපෙමි ඔබ යන්න - වැලප ඇති පල කිම් ද?
ඔබේ නම අදින් පසු තවත් මට අයිති නෑ
ඔබ නැත ද ජීවිතේ නසාගත හොහැක මට
ඔබ යන්න ජීවිතේ සොයාගෙන සොයාගෙන

ඔබ යන්න මධුරතර සප්ත ස්වරයත්      අරන්
ඔබේ රථ මැදිරියට මගේ ඉර-හඳ      අරන්
ඔබ යන්න මහද තෙත් වැහි වලාකුළ      අරන්
කමක් නෑ ඔබ යන්න - මගේ ආයුස      අරන්

දේදුන්න පායාවී හෙටත් පාලම උඩින්
ඔබ නැතත් - මම එතැන පාට හත ගණින්නම්
ඔබ යන්න හැරී නොබලා ඔබේ කිරුළ ගෙන
පරාජිත කඳුළකට ඇසේ ඉඩ තියා නැත

වෙස්මුහුණ පැලඳගෙන සිටින තැන හිතක් නැත
ගෙවදින්න ඇති නිසා හෙට අලුත් විමානෙට
පෙම් ගී අලංකාර වීසි කොට යනු මැනවි
නිල් ගුවන් ගැබ වදින කුරුල්ලෙකු පරිද්දෙන්
ඔබ ඔබේ සිහිනයට - මම මගේ ලෝකයට

හෙමෙන් මා අත අතැර - දෙපස හෙවණැලි අතර
ඔබ සෙමෙන් හැංගුණේ, එය වඩා විනීතයි
එදා ඔබ ගෙයි මුල්ලේ - සොයාගත් මං දිනුම්
ඔබ සැඟව ගියෙ කොයි ද - සොයන්නේ නෑ ඉතින්
ජය පරාජය කවුද - මට එයින් පලක් නැත

ආදරය නින්දක් ද - පිබිදිලා සිටින මට
දිනෙන් දින මගේ නෙත් පැහැදුල් ය, සුවිපුල් ය
නින්ද තුළ නැති වුණේ එක දෙය යි - වරදක් ද?
තව බොහෝ දේ තිබේ - ජීවිතේ ජය ගනිම් (ලකුණු 12 යි)

02) (අ) දඹදෙණි අවධිය ගද්‍ය-පද්‍ය සාහිත්‍ය නිර්මාණ ප්‍රවර්ධනයට හේතු වූ ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

(ආ) සද්ධර්මරත්නාවලිය ගැමි සුවඳ පිරුණු බණකතා කෘතියක් වන්නේ ඇයිදැයි සහේතුක ව විමසන්න (ලකුණු 08 යි)

**නැතහොත්**

ජාතක කතාකරුවා අද්භූත සිදුවීම් යොදා ගත්ත ද සියුම් ලෙස ජීවිත විවරණය කරන්නෙකි. නියමිත ජාතක කතා ඇසුරෙන් සනාථ කරන්න. (ලකුණු 15 යි)

03) සද්ධර්මාලංකාරය වූ කලී සුචරිතවාදී සමාජයක් බිහි කරලීමේ අරමුණින් රචනා කරන ලද්දකි. නියමිත කතා වස්තු ඇසුරෙන් සනිදර්ශන ව පැහැදිලි කරන්න . (ලකුණු 15 යි)

**නැතහොත්**

පූජාවලී කතුවරයා ස්වකීය කතා තුළ හමුවන චරිත හා සිදුවීම් ශ්‍රාවක සිත් සතන් ඇද බැඳ තබා ගත හැකි පරිදි මෙහෙයවා ඇති අයුරු ප්‍රශංසනීය වන බව නියමිත කතා ඇසුරින් අගයන්න. (ලකුණු 15 යි)

04) ගුත්තිලය රමණීය කාව්‍යයක් බව උදේනී පුර සැණකෙළි වර්ණනාව ඇසුරින් නිදසුන් සපයමින් පැහැදිලි කරන්න (ලකුණු 15 යි)

06) ලාංකේය සමාජ ප්‍රශ්නයක් ළමයින්ගේ ලොවට බලපෑම් කර ඇති අයුරු කලාත්මකව හා සංවේදී ව ගෙන හැර පාන අවස්ථාවක් "අකුරට යන වෙලාවේ" කෙටිකතාව තුළ හමුවේ විමසන්න. (ලකුණු 15 යි)

07) නව කවියේ මානව ධර්මතා නිරූපණය කෙබඳුදැයි සනිදර්ශන ව සාකච්ඡා කරන්න (ලකුණු 15 යි)

05) නවකතාව යනු මානව ජීවිතය දිගු-පුළුල් අන්දමින් නිරූපණය කරන්නක් බව බැද්දේගම ඇසුරින් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න (ලකුණු 15 යි)

08) නාට්‍ය රසයට එහා ගිය කාව්‍ය රසයක් ද වැහෙන මනරම් සාහිත්‍ය නිර්මාණයක් ලෙස "පේමතෝ ජායතී සොකෝ" නාට්‍යය විග්‍රහ කළ හැක්කේ කෙසේදැයි උදාහරණ සහිත ව පහදන්න. (ලකුණු 15 යි)

සැකසුම : දර්ශනපති **ගිහාන් හෙට්ටිආරච්චි**

ගිහාන් හෙට්ටිආරච්චි